# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මෙම විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල **දැනට ස්ථිර සේවයේ නියුතු, තනතුරෙහි තහවුරු කරන ලද සේවක භවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.**

සියළුම අයදුම්කරුවන් කොළඹ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙහි (cmb.ac.lk) පළකරන ලද ගූගල් පෝරම් සබැඳිය (Google form link) ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. (**ඒ සඳහා මේ සමග අමුණා ඇති උපදෙස් පත්‍රිකාව අනුගමනය කරන්න.**) එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඩ පිටපත (Hard Copy) සහතික කරන ලද සහතිකවල පිටපත් සමග තමා සේවය කරන ආයතනයේ ලේකම්/මණ්ඩපාධිපති/ ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ මගින් **2025.10.01** දින හෝ එදිනට පෙර **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය, නො.94, කුමාරතුංග මුණිදාස මාවත, කොළඹ 03** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මාර්ගගත ක්‍රමය යටතේ (Online) අයදුම්පත් යොමු කිරීම සහ එහි දෘඩ පිටපත සහතික කරන ලද සහතිකවල පිටපත් සමග යොමු කිරීම අනිවාර්යය වන අතර එසේ නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පහත දැක්වෙන ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර එම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණා එවනු නොලබන අයදුම්පත්, අසම්පූර්ණ, අතින් සකසන ලද හෝ ආදර්ශ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සලකා බලනු නොලැබේ.

## 1. විගණන සහකාර II ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. අ.පො.ස (සා.පෙළ) විභාගය සිංහල භාෂාව / දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව /ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.

**සහ**

2. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වී තිබිය යුතුය. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) [අ.පො.ස (උ.පෙළ) විභාගය පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් වීම ප්‍රමාණවත් වේ.]

**සහ**

3. **තනතුර සඳහා විශේෂිත සුදුසුකම්**

   i. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) මගින් පිරිනමනු ලබන මූලික මට්ටම / බලපත්‍ර මට්ටම - I / පදනම් මට්ටම / Certified Business Accountant (CAB I)/ විධායක මට්ටම හෝ ඊට සමාන සුදුසුකමක් ලබාගෙන තිබීම.

**හෝ**

   ii. වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනය (Chartered Institute of Management Accountants – CIMA) මගින් පිරිනමන පදනම් මට්ටම (Foundation Level) ලබාගෙන තිබීම.

**හෝ**

   iii. ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (HNDA) ලබාගෙන තිබීම.

**හෝ**

   iv. ශ්‍රී ලංකා ගණකාධිකරණ තාක්ෂණික ශිල්පීය ආයතනය (Association of Accounting Technicians of Sri Lanka – AAT) මගින් පිරිනමන AAT (ශ්‍රී ලංකා) සාමාජිකත්ව සහතිකය ලබාගෙන තිබිය යුතුය.

**සහ**

4. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දෙක (02) ක පළපුරුද්දක් තිබිය යුතුය.

   මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් සම්බන්ධව පිළිගත් ආයතනයකින් ලබාගත් සුදුසුකම ඇති අයදුම්කරුවන්ට විශේෂත්වයක් දෙනු ලැබේ.

**සටහන -**

අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධයෙන්, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ, රාජ්‍ය අංශය තුළ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම්කරණය/විගණනය සම්බන්ධව ලබාගත් පළපුරුද්ද, ඉහත 4 වගන්තිය යටතේ සඳහන් විගණන පළපුරුද්ද සඳහා සලකා බලනු ලැබේ.

**වැටුප් පරිමාණය** : UMN 2 (II) - රු. 61,275 – 18 x 890 – 77,295 (මාසික)

**බඳවා ගනු ලබන ආකාරය** : ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 2. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය "අ" ඛණ්ඩය

**සුදුසුකම්:**

1. ජාතික තාක්ෂණවේද ඩිප්ලෝමාව හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.
2. ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව.
3. පහත ක්ෂේත්‍ර අතුරින් එක් ක්ෂේත්‍රයකට හෝ කිහිපයකට අදාලව උසස් තාක්ෂණ ඩිප්ලෝමාව

**හෝ**

4. පිළිගත් ආයතනයකින් ලබාගත් පහත ක්ෂේත්‍ර අතුරින් එක් ක්ෂේත්‍රයකට හෝ කිහිපයකට අදාලව වර්ෂ 2 කට නොඅඩු (පූර්ණකාලීන) ඩිප්ලෝමා සහතිකය සමඟ අදාල ක්ෂේත්‍රයේ එක් වර්ෂයක පළපුරුද්දක් ලබා සිටීම.

ඉහත 1 සිට 4 දක්වා සුදුසුකම් වලට පහත සඳහන් ක්ෂේත්‍රයන් අදාල වේ.

- වෛද්‍ය රසායනාගාර
- පොලිමර් සහ රසායනික
- යාන්ත්‍රික ඉංජිනේරු
- ක්ෂුද්‍ර ජීව විද්‍යාව හා/හෝ අණුක ජීව විද්‍යාව
- ජෛව තාක්ෂණය
- උද්භිද විද්‍යාව
- කෘෂිකාර්මික හා/හෝ පාරිසරික විද්‍යා/පාරිසරික ඉංජිනේරු
- විශ්ලේෂණ රසායන විද්‍යාව
- විකිරණ ශිල්පය /වෛද්‍ය ප්‍රතිබිම්භ තාක්ෂණය
- න්‍යෂ්ටික විද්‍යාව
- ජෛව තොරතුරු විද්‍යාව
- පරිසර විද්‍යාව
- පරිසර සංරක්ෂණය සහ කළමණාකරණය
- ඉහත ක්ෂේත්‍රයන්ට අදාල වන්නාවූ වෙනත් ක්ෂේත්‍ර

පහත සුදුසුකම් ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(අ) වෛද්‍ය රසායනාගාර තාක්ෂණ විද්‍යාව පිළිබඳ උපාධිය

(ආ) ජෛව වෛද්‍ය විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය පිළිබඳව උපාධිය

(ඇ) ක්ෂුද්‍ර ජෛවවේදය පිළිබඳ උපාධිය

(ඈ) විශ්ලේශණ රසායන විද්‍යාව පිළිබඳ උපාධිය

(ඉ) ඉලෙක්ට්‍රොනික විද්‍යාව/යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව/රසායනික විද්‍යාව/රසායනික ඉංජිනේරු විද්‍යාව විෂයන්ට අදාල උපාධිය

(ඊ) විකිරණ ශිල්පය /වෛද්‍ය ප්‍රතිබිම්භ තාක්ෂණය පිළිබද උපාධිය

(උ) න්‍යෂ්ටික තාක්ෂණය පිළිබද උපාධිය

(ඌ) පරිසර විද්‍යාව පිළිබද උපාධිය

(එ) වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය (MLT)

(ඒ) විකිරණ ශිල්පියෙකු ලෙස ලියාපදිංචිය ලබා තිබීම

**වැටුප් පරිමාණය** : U-MT 1(II) රු. 57,435 – 7 x 640 – 9 x 890-69,925 (මාසික)

**බඳවා ගනු ලබන ආකාරය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 3. පරිපාලක (විදුලි) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම හා ඒ සම්බන්ධ වර්ෂ 03ක පළපුරුද්ද ලබා තිබීම. (ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හදාරන අතරතුර ලබා ගන්නා පළපුරුද්ද ද ගණන් ගනු ලැබේ.)

**හෝ**

2. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් සමත් වීම හා අදාල ක්ෂේත්‍රයේ අධීක්ෂකවරයෙකු වශයෙන් රජයේ ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක වර්ෂ 05 ක පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : UMT 1 (III) - රු.51,095-7x540;10x640 – 60,575 (මාසික)

**බඳවා ගනු ලබන ආකාරය** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 4. පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය

**සුදුසුකම්:**

1. ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම හා ඒ සම්බන්ධ වර්ෂ 03ක පළපුරුද්ද ලබා තිබීම. (ජාතික තාක්ෂණය පිළිබඳ සහතිකය හදාරන අතරතුර ලබා ගන්නා පළපුරුද්ද ද ගණන් ගනු ලැබේ.)

**හෝ**

2. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් සමත් වීම හා අදාල ක්ෂේත්‍රයේ අධීක්ෂකවරයෙකු වශයෙන් රජයේ ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක වර්ෂ 05 ක පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : UMT 1 (III) - රු.51,095-7x540;10x640 – 60,575 (මාසික)
**බඳවා ගනු ලබන ආකාරය** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 5. පුහුණුවන තාක්ෂණික නිලධාරී

**සුදුසුකම්:**

(අ) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ පහක් (05) සහිතව අ.පො.ස. සා/පෙළ විභාගය විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**හෝ**

(ආ) තුන්වරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව විෂයන් ඇතුළුව අ.පො.ස. සා/පෙළ විභාගය විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක අවුරුදු අටක (08) සතුටුදායක ස්ථිර සේවයක් කර තිබීම.

**හෝ**

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක විද්‍යාගාර සහායක තනතුරක වසර පහළොවක (15) සතුටුදායක ස්ථිර සේවයක් කර තිබීම.

**වැටුප් පරිමාණය** : UMT 1 (III) - රු.51,095-7x540;10x640 – 60,575 (මාසික)
**බඳවා ගනු ලබන ආකාරය** : යෝග්‍යතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 6. තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) III ශ්‍රේණිය

**සුදුසුකම්:**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනක් (03) එකවර සමත් වීම.

**සහ**

2. තොරතුරු සන්නිවේදනය සහ බහු මාධ්‍ය තාක්ෂණය/ තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණය/තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන:-**
තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සහිත අයහට විශේෂත්වයක් ලබා දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය** : UMT 1 (III) - රු.51,095-7x540;10x640 – 60,575 (මාසික)
**බඳවා ගනු ලබන ආකාර**ය : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 7. තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය

**සුදුසුකම්:**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනක් (03) සමත් වීම.

**සහ**

2. (අ) ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

(ආ) ඉහත 2 (අ.) කොටසෙහි සඳහන් සුදුසුකම්වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ලබාගත් තාක්ෂණික සුදුසුකම් සමඟ පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම

**වැටුප් පරිමාණය** : UMT 1 (III) - රු.51,095-7x540;10x640 – 60,575 (මාසික)
**බඳවා ගනු ලබන ආකාර**ය : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 8. තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය

**සුදුසුකම්:**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ විෂයන් තුනක් (03) එකවර සමත් වීම.

**සහ**

2. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි හෝ සමාන ක්ෂේත්‍රයක, තෘතීයීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : UMT 1 (III) - රු.51,095-7x540;10x640 – 60,575 (මාසික)
**බඳවා ගනු ලබන ආකාර**ය : ලිඛිත සහ/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ
පරීක්ෂණයක් මඟින්

## 9. පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වී තිබීම. සමත් විෂයයන් අතරට සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය ඇතුළත් විය යුතුය.

**සහ**

2. උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රාථමික මට්ටමේ එනම් U-PL වැටුප් කාණ්ඩයට අයත් ස්ථිර තනතුරක් දරණ එම තනතුරෙහි තහවුරු කරන ලද උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ අවම වශයෙන් වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද අයෙකු වීම.

**සටහන:-**

පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් භාවිතය සම්බන්ධව පිළිගත හැකි සුදුසුකමක් ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය** : UMN 1 (III) - රු. 49,475-17x540– 58,655 (මාසික)
**බඳවා ගනු ලබන ආකාර**ය : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 10. රියදුරු III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**සහ**

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත සේවකයකු වීම.

**වැටුප් පරිමාණය** : U PL 3 (III) - රු. 48,005 - 16 x 490 – 55,845 (මාසික)

**බඳවා ගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 11. විදුලි කාර්මික III ශ්‍රේණිය
## 12. පෙදරේරු III ශ්‍රේණිය
## 13. කාර්මික III ශ්‍රේණිය

ඉහත අංක 11,12 සහ 13 තනතුරු සඳහා

**සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා විදුලි කාර්මික/පෙදරේරු/කාර්මික තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා විදුලි කාර්මික/පෙදරේරු/කාර්මික යන ක්ෂේත්‍රවල අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද සමඟ විදුලි කාර්මික/පෙදරේරු/කාර්මික තනතුරට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 2 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා ඇති බව වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

ඊට අමතරව, අයදුම්කරුවන් :

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ. තනතුරේ කාර්යභාර සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ. මනා චරිතයකින් යුතු විය යුතුය.

**වැටුප් පරිමාණය** : U PL 3 (III) - රු. 48,005 - 16 x 490 – 55,845 (මාසික)
**බඳවා ගනු ලබන ආකාර**ය : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 14. විද්‍යාගාර සහායක III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1.

I. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම හා තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

**II.** ප්‍රාථමික මට්ටමේ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

2. ප්‍රාථමික මට්මේ නොපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : U PL 2 (III) - රු. 44,575 - 16 x 490 – 52,415 (මාසික)
**බඳවා ගනු ලබන ආකාර**ය : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සැලකිය යුතුයි:**

මෙම තනතුරුවලට බඳවා ගැනීමේ දී වැටුප් පිහිටවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනය සඳහා වන ආයතන සංග්‍රහය -2023 හි VI වන පරිච්ඡේදයේ 6.5 හා 26 උප වගන්තිය අනුව වේ.

**ලේඛකාධිකාරී**
කොළඹ විශ්වවිද්‍යාලය

2025.09.18